# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 ජනවාරි මස 19 වන දින

## **II** වන කොටස

## අතිරේකය

**(2018.01.19 දින නිකුත් කරන ලදී)**

# සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ

**ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමනාකරණය කරනු පිණිස සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ණය එකතුකර ගැනීමට බලය ලබා දීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 18.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ

එල්.ඩී.—ඕ. 36/2017.

**ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමනාකරණය කරනු පිණිස සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ණය එකතුකර ගැනීමට බලය ලබා දීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 2018 අංක   දරන සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

*අරමුණ.*

2. මධ්‍ය කාලීන සිට දිගු කාලීන දක්වා වන කාල තුළ ආණ්ඩුවේ මුදල් අවශ්‍යතා සහ ගෙවීම් සම්බන්ධව වගකීම් විචක්ෂණශීලී අවදානම් මට්ටමකට අනුකූලව හැකිතාක් අවම පිරිවැයක් යටතේ දරනු ලබන බව සහතික කිරීම පිණිස රාජ්‍ය ණය කළමනාකරණය කිරීම, මේ පනතේ අරමුණ වන්නේ ය.

*රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ණය ලබා ගැනීම.*

3. පාර්ලිමේන්තුව විසින්, කලින් කලට, ආණ්ඩුවේ රාජ්‍ය ණය, ප්‍රතිමුල්‍යනය කිරීමේ සහ පූර්ව මුල්‍යනය කිරීමේ කාර්ය සඳහා, ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ, (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ, (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ හෝ 1957 අංක 29 දරන විදේශීය ණය පනතේ විධිවිධාන ඇතුළුව මුදල් එකතු කර ගැනීම සඳහා අදාළ වන නීති ප්‍රකාරව, යම් නිශ්චිත මුදල් වර්ෂයක් තුළ, එම මුදල් වර්ෂයට ඉහතින් වූ මුදල් වර්ෂයේ අවසානයට ගෙවීමට ඉතිරිව ඇති සමස්ථ ණයෙන් සියයට දහයක් නොඉක්මවන්නා වූ මුදලක් ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් පිටතින් හෝ ණය මුදලක් ලෙස එකතු කර ගැනීම සඳහා යෝජනා සම්මතයක් මගින් අනුමතය ලබා දෙනු ලැබිය හැකි ය.

*ආණ්ඩුවේ වගකීම් පියවීම.*

4. (1) අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව සහ, මෙම පනතේ 3 වන වගන්තියේ විධිවිධාන සහ (422 වන

2—PL 010583—475 (2018/01)

අධිකාරය වූ) මුදල් නීති පනතේ 114 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව—

(අ) ණයක් මගින් එකතු කර ගත යුතු මුදල් ප්‍රමාණය;

(ආ) එම ණය ලබා ගනු ලබන ආකාරය: සහ

(ඇ) පවත්නා ණය පෙරාතු මිළ දී ගැනීම සහ පවත්නා ණය අලුත් ණය සමග හුවමාරු කිරීම ඇතුළු, එකී ආණ්ඩුවේ එම ගෙවීමේ වගකීම් පියවීම සඳහා යෝග්‍ය බවට අමාත්‍යවරයා විසින් සළකනු ලබන ආකාරය,

ඇතුළු රාජ්‍ය ණය ප්‍රති මූල්‍යනය සහ පූර්ව මූල්‍යනය කිරීම සම්බන්ධයෙන් සහ එයට අදළ ආනුෂංගික කාරණා පිළිබඳ තීරණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණය ශ්‍රී ලංකා මහ බැංකු විෂයය පවරා ඇති අමාත්‍යවරයා මගින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව දන්වනු ලැබිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින්, එම දැන්වීමෙහි නියම සහ අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරනු ලැබිය හැකි යම් විධානයන්ට යටත්ව—

(අ) එම ණය එකතු කර ගැනීමට අවශ්‍ය විය හැකි එවැනි සියලු සැලසුම් සකසනු ලැබිය හැකි ය; සහ

(ආ) ආණ්ඩුවේ යහපත උදෙසා ලබා ගත හැකි වඩාත් වාසිදයක නියමයන් මත ආණ්ඩුවේ වගකීම පියවීම සඳහා එම සැලසුම් බලාත්මක කරනු ලැබිය හැකි ය.

**5.** ආණ්ඩුවේ රාජ්‍ය ණය ප්‍රති මූල්‍යනය සහ පූර්ව මූල්‍යනය කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුව සඳහා හෝ ආණ්ඩුව වෙනුවෙන් එකතු කරගනු ලබන යම් ණයක්, 2017 අංක 30 දරන විසර්ජන පනතේ 2 (1) (ආ) වගන්තියේ විධිවිධාන අදළ වීමෙන් ද එසේ ම 2017 අංක 30 දරන විසර්ජන පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයෙන් පසු පනවනු ලබන යම් වාර්ෂික විසර්ජන පනතක විධිවිධාන අදළ වීමෙන් ද නිදහස් විය යුතු ය.

විසර්ජන පනතේ විධිවිධාන අදළ වීමෙන් නිදහස් වීම.

ණය, ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව.

**6.** (1) මේ පනත යටතේ එකතු කර ගනු ලැබූ යම් ණයක්, එහි—

(අ) මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වන අවස්ථාවක, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 107 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, භාණ්ඩාගාර ලේකම්වරයා විසින්, තත්කාර්ය සඳහා, ලිඛිතව නම් කරනු ලැබිය හැකි නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ පවත්වාගෙන යනු ලබන එක් ගිණුමක හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාවක රඳවා ගත යුතු ය;

(ආ) මුදල් ඒකකය විදේශ ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, භාණ්ඩාගාර ලේකම්වරයා විසින්, තත්කාර්ය සඳහා, ලිඛිතව නම් කරනු ලැබිය හැකි නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන එක් ගිණුමක හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාවක රඳවා ගත යුතු ය.

(2) ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක ඇති මුල් මුදල සහ යම් පොළියක් වේ නම්, එම පොළිය අදාළ ශ්‍රී ලංකාවේ වත්කම් ලෙස එහෙත් ආරක්ෂිත සංවෘත ගිණුමක් ආකාරයෙන් ඒකාබද්ධ අරමුදලෙහි කොටසක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ රඳවා ගනු ලබන මුදල් මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය ප්‍රති මූල්‍යනය සහ පූර්ව මූල්‍යනය කිරීමේ කාර්ය සඳහා පමණක් භාවිත කළ යුතු ය.

2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ වාර්තා කිරීම.

**7.** 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ සභාගත කිරීම අවශ්‍ය වන්නා වූ ආණ්ඩුවේ මූල්‍ය කාර්ය සාධනයට අදාළ වාර්තාවට මේ පනතේ විධිවිධාන යටතේ ලබා ගත් සියලු ණය, ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන ගිණුම්වල රඳවා ගනු ලබන මුදල් සහ ආණ්ඩුවේ වගකීම් පියවීම සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් කළ යුතු ය.

මුද්දර ගාස්තුවලින් නිදහස් බව.

**8.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ විධිවිධාන යටතේ සාදනු ලබන හෝ භාවිත කරනු ලබන සියලු ලේඛන හෝ සාධන පත්‍ර මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු ය.

අපරාධ හෝ සිවිල් නඩු කටයුතුවලින් ආරක්ෂාව.

**9.** (අ) මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකු;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු, සේවා නියුක්තකයකු, සේවකයකු හෝ නියෝජිතයකු; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නිලධරයකු, සේවා නියුක්තකයකු, සේවකයකු හෝ නියෝජිතයකු වන්නා වූ කිසිම තැනැත්තකු,

තමා විසින් සද්භාවයෙන් ක්‍රියාකොට ඇති බව ද සියලු නිසි උද්‍යෝගය, සාධාරණ සැලකිල්ල සහ නිපුනතාව දක්වා ඇති බව ද ඔප්පු කරන්නේ නම්, ඔහු විසින් මේ පනත යටතේ හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියෝගයක්, නියමයක්, තීරණයක් හෝ විධානයක් යටතේ ඇති සිය වගකීම් ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අදහස් කිරීමේ දී කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් දෙයක් සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවකට හෝ වෙනත් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය.

නියෝග.

**10.** (1) අමාත්‍යවරයා විසින් මුදල් මණ්ඩලයේ උපදෙස් මත, මේ පනතින් නියම කිරීමට නියම කර ඇති සියලු කාරණාවලට අදාළව හෝ මේ පනතින් නියෝග සෑදීමට බලය ලබා දී ඇත්තේ යම් කාරණාවලට අදාළව ද, එම කාරණාවලට අදාළව නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවකට අදාළව නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) ණය ප්‍රති මූල්‍යනය කිරීම සහ පූර්ව මූල්‍යනය කිරීම කරනු ලැබිය යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද එම කොන්දේසි;

(ආ) ණය ප්‍රති මූල්‍යනය සහ පූර්ව ප්‍රති මූල්‍යනය කිරීමට අදළ ආකාරය සහ කාර්ය පටිපාටිය; සහ

(ඇ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් කාරණා.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරන ලද දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක සිට ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එකී නියෝගය *ගැසට් පත්‍රයේ* පළකරන ලද දිනයේ සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකළ එකී යම් නියෝගයක්, ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සළකනු ලබන දිනය පිළිබඳ දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් බලතල අභිනියෝජනය කිරීම.

**11.** අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයන් මගින් එම නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසි, වෙන්කිරීම් සහ සීමාකිරීම්වලට යටත් ව, මේ පනතේ 4 වන සහ 10 වන වගන්ති මගින් අමාත්‍යවරයා වෙත පැවරී ඇති යම් බලතල හැර අනෙකුත් බලතල භාණ්ඩාගාර ලේකම්වරයා වෙත අභිනියෝජනය කරනු ලැබිය හැකි ය.

වැරදි.

**12.** මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් මිලියන තුනකට නොඅඩු සහ රුපියල් මිලියන දහයක් නොඉක්මවන්නා වූ ද, දඩයකට හෝ එම වරදින් ආණ්ඩුවට මූල්‍යමය පාඩුවක් හෝ මූල්‍යමය අගයකින්

ප්‍රමාණීකරණය කළ හැකි පාඩුවක් සිදුව ඇති විට දී, එකී පාඩුවේ අගය මෙන් දෙගුණයක අගයකට සමාන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ එම තැනැත්තා යටත් විය යුතු ය.

මේ පනත වෙනත් නීති අභිබවා බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපනය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ —

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"මුදල් වර්ෂය" යන්නෙන්, ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වී දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලසීමාව අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන්, වාණිජ බැංකු කටයුතු සිදු කිරීම සඳහා 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද බලපත්‍රලාභී බැංකුවක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"පූර්ව මුල්‍යනය" යන්නට, හිඟව පවතින යම් ණයක කොන්දේසි සහ නියමයන් වෙනස් කිරීම පිණිස එකී ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කලින් සකසනු ලබන මූල්‍ය සැලසුම් ඇතුළත් වේ;

"රාජ්‍ය ණය" යන්නෙන්, ආණ්ඩුව විසින් එකතු කරගත් හෝ ඇප වූ ණය සහ නිකුත් කළ හෝ ඇප වූ සුරැකුම්පත්වල ප්‍රතිඵලයක් ලෙස ලැබෙන සියලු මූල්‍ය වගකීම් අදහස් වන අතර, ඊට එම ණයට අදාළ පොළී, නිදන්ගත අරමුදල් ගාස්තු, ණය ආපසු ගෙවීම හෝ ක්‍රම ක්‍රමයෙන් ණය ක්ෂය කිරීම සහ ආණ්ඩුවේ ආදායම් සුරැකුම්කොට ලබාගත් ණය සම්බන්ධයෙන් වියදම් සහ එමගින් ඇති වූ ණය ගෙවීම සහ නිදහස් කර ගැනීම සඳහා වන සියලු වියදම් ඇතුළත් වේ ;

"ප්‍රති මූල්‍යනය" යන්නට, හිඟව පවත්නා ණයක් හෝ ණය, වෙනත් ණයක් හෝ ණය වෙනුවට ආදේශ කිරීම ඇතුළත් වේ ; සහ

"රෙජිස්ට්‍රාර්වරයා" යනනෙන්, (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ විධිවිධාන යටතේ පත් කළ රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ.

**15.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.